# ශ්‍රී ලංකාවේ උතුරු දිග මුහුදු කලාපයේ පුරාවිද්‍යා ගවේෂණය: ගවයින්ගේ දූපත හෙවත් ඩෙල්ෆ්හි සිදුකළ පුරාවිද්‍යා ගවේෂණයෙන් අනාවරණය වූ පුරාවිද්‍යා සාධක

**මහින්ද කරුණාරත්න, ඒ.එම්. ඒ දයානන්ද, නදීකා කුමාරි, චමිලා කුමාරි, සමීර ප්‍රසංග, ඉන්දික උපුල්, රුක්ෂාන් ප්‍රියන්දන, නන්දදාස සමරවීර, රසික මුතුකුමාරන, ඩබ්. එම් චන්ද්‍රරත්න**

මුහුදු පුරාවිද්‍යා ඒකකය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොටුව, ගාල්ල
archaeology.lk / mahindakandy222@gmail.com / 071 994 5046

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපය හා තදාශ්‍රිත කලාපයේ ව්‍යාප්ත ව ඇති දූපත් 18න් එකකි ඩෙල්ෆ් දූපත. වර්ගකිලෝමීටර 47.5ක පැතිරී ඇති මෙම දූපත දෙමළ බසින් නඳුන්තීව්/පශුන්තීව් ලෙස හැඳින්වෙන අතර එයට ගවයින්ගේ දිවයින යන සිංහල අර්ථය ගත හැක. තම මව්බිමේ නගරයක් වන ඩෙල්ෆ් යන්න මෙම දිවයින හැඳින්වීම සඳහා ලන්දේසින් විසින් භාවිත කරන ලදු ව, ඉංග්‍රීසීන් ද එම වචනය ම භාවිත කොට ඇත. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය විසින් මෙම දූපත හා තදාශ්‍රිත මුහුදු හා ගොඩබිම් කලාපයේ පුරාවිද්‍යා ගවේෂණක් 2013 අගෝස්තු 16-20 කාලය තුළ සිදුකරන ලද අතර එහි දී අනාවරණය වූ තොරතුරු මෙම පර්යේෂණ පත්‍රිකාව ඔස්සේ සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

## ක්‍රමවේදය

ලිඛිත මූලාශ්‍ර, සිතියම් හා ප්‍රදේශවාසි ජනයා හමු වී ලබාගත් තොරතුරු ඔස්සේ මෙම කලාපය පිළිබඳ මූලික අවබෝධයක් ඇති කොටගෙන එම තොරතුරු පාදක කොටගනිමින් ගවේෂණය සඳහා අවැසි උපාය හා උපක්‍රම සලසාගන්නා ලදි. දත්ත අනාවරණය හා තහවුරු කරගැනීම සඳහා වෙරළබඩ කලාපයේ මතුපිට ගවේෂණය, නොගැඹුරු මුහුදේ ස්නෝක්ලින්කරණය හා ගැඹුරු මුහුදු කලාපයේ කිමිදීම යන උපක්‍රම අනතුරු ව දියත් කරන ලදි. අනාවරණය වූ දත්ත විවිධ ක්‍රමවේද ඔස්සේ වාර්තා කරන ලදී. සටහන් පොත්, ස්ලේට් භාවිතය, මිනුම, දළ හා මිනුම් සහිත සටහන් ඇඳීම සිදු කරන ලදී. අවශ්‍යය ස්ථානයන්හි දී ඡායාරූප හා වීඩියෝ ගත කිරිම මෙන් ම ස්ථානීය භූගෝලීය ව්‍යාප්තිය හා දිශාව ද සටහන් කරගන්නා ලදි.

උපකරණ : ස්කූබා කිමිදුම් කට්ටලය, ගාමින් (Garmin) GPS යන්ත්‍රය, Sony Xperia U ජංගම දුරකථන කැමරාව, ස්ලේට්, මාලිමාව, මිනුම් පටි

## පර්යේෂණය

මෙම ගවේෂණය මුඛ්‍ය කලාප ත්‍රිත්වයක් ඔස්සේ දියත් කරන ලදී. එ නම්, 1. මුහුදු අභ්‍යන්තරයේ ගවේෂණය, 2. වෙරළබඩ ප්‍රදේශයේ ගවේෂණය හා 3. වෙරළ හා තදාශ්‍රිත ගොඩබිම් කලාපයේ සිදුකළ ගවේෂණය වශයෙනි.

**1. මුහුදු අභ්‍යන්තරයේ ගවේෂණය :** අවට මුහුදේ ගිලී ඇති නෞකා කිසිවක් ඇත්දැයි සොයා බැලුව ද කිසිදු තොරතුරක් හමු නොවූ අතර වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා මුහුද අභ්‍යන්තර කිමිදුම් කටයුතු සිදුවිය. පැරණි ලන්දේසි ජැටියට ඉදිරිපස කලාපයේ කිමිදුම සිදුකරන ලද අතර මුහුදු පත්ලේ පැවති තද මඩ තට්ටුව නිසා ගවේෂණ කටයුතු සිදුකිරීම අභියෝගයක් විය. නැංගුරමකට සවිකරන ලද නූලක් ආධාරයෙන් මෙම ස්ථානයේ චක්‍රීය කිමිදුම්

විපරම (Circle Search) සිදුකරන ලදි. මෙම විපරමේ දී කිසිදු මානව කෘතියක් හෝ පුරාවිද්‍යා අවශේෂයක් වාර්තා වූයේ නැත.

**2. වෙරළබඩ ප්‍රදේශයේ ගවේෂණය :** මෙම කලාපයේ පාදචාරිකා ගවේෂණය, පැහැදිලි හා නොගැඹුරු මුහුද ප්‍රදේශයන්හි ස්නෝක්ලින්කරණය මගින් විපරම් කිරීම ප්‍රධාන වශයෙන් සිදු විය. මෙහි දී ජැටි 2ක් පිළිබඳ කරුණු අනාවරණය විය.

<u>අංක I ජැටිය</u> - පැරණි ලන්දේසි කොටුව හා සුසාන භූමිය ඉදිරිපස පිහිටා ඇත. දූපතෙන් සුලභ ව හමුවන හිරිගල් භාවිත කොට වෙරළට සමීපව ඉදිකොට ඇති මෙම ජැටියේ දිග හා පළල ආසන්න වශයෙන් මීටර 24×4කි. මෙම ජැටිය අදින් වසර 5කට පමණ පෙර නිර්මාණය කළ එකක් බව අනාවරණය විය (රාමන් ජේ. සුදාකරම් සමග 2013.8.17 දින සිදුකළ සාකච්ඡාව).

<u>අංක II ජැටිය</u> (09 31 898N, 79 41 633E) - ජැටියේ දිග මීටර 130ක් පමණ හා අග කොටස පළල මීටර 11.50ක් පමණ ද මැද කලාපය මීටර 9.70 පමණ ද වේ. මුල් කොටස ගල් අතුරා සකස් කොට ඇත. ජැටිය නොගැඹුරු මුහුදු තීරය අවසන් වනතෙක් ඉදිකොට ඇත. බාහිර ස්වරූපය හා ඉදිකිරීම් ලක්ෂණ අනුව ලන්දේසි පාලන සමයේ දී ඉදිකොට ඇති බව සිතිය හැකි ය.

**3. වෙරළ හා තදාශ්‍රිත ගොඩබිම් කලාපයේ සිදුකළ ගවේෂණය :** මෙම කලාපයේ බෞද්ධ ස්තූප නටඹුන්, ලන්දේසි කොටුව, අශ්වගාල හා පැරණි ළිඳ, ක්වීන්ස් ටවර්, පරෙවි කුළුණ, රාම පාදය, ලියලන ගල හා බයොබැබ් ශාකය වැනි පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන පිළිබඳ සාධක හමු විය.

**අ. ස්තූප නටඹුන් :** වෙරළේ සිට මීටර 100ක් පමණ ගොඩබිමට වන්නට පිහිටා ඇත. ඩෙල්ෆ් දිවයිනේ ඉහළ උන්නතාංශයක් දක්වන ස්ථානයක මෙම විහාරය පිහිටා ඇති අතර එකිනෙකට වෙනස් ප්‍රමාණයේ ස්තූප 3ක් දක්නට ලැබේ.

**අංක I ස්තූපය** (09 32 306N, 079 39 184E) - විශ්කම්භය මීටර 13.54ක් ද පරිධිය මීටර 31.93ක් ද වන මෙහි ඇති විශාලම ස්තූපයයි. පවතින ශේෂයන් ගේ උපරිම උස සෙන්ටිමීටර 58කි. සළපතල මළුවේ අභිලේඛන 3ක් නිරීක්ෂණය කළ හැක. එයින් එකක් ක්‍රිස්තු වර්ෂ 1/2 සියවස්වලට අයත් පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනයක් වන අතර අනෙක් ලිපි දෙක ක්‍රිස්තු වර්ෂ 14/15 සියවසට පසුකාලීන දෙමළ අක්ෂරයන්ගෙන් සටහන කරන ලද ලිපි වේ.

**අංක II ස්තූපය** (09 32 307N, 079 29 194E) - අංක I ස්තූපයට වම් පසින් ස්ථානගත වන අතර එම ස්තූපයට වඩා කුඩා, පාදම පමණක් ශේෂ වී ඇති ස්තූපයකි. විශ්කම්භය මීටර 6.10ක් හා පරිධිය මීටර 15.58 ක් වේ.

**අංක III ස්තූපය** (09 32 309N, 079 39 137E) - අංක I ස්තූපයට දකුණු දෙසින් මෙම ස්තූපය පිහිටා ඇත. විශ්කම්භය මීටර 2.94කි. (සළපතල මළුව සමග විශ්කම්භය මීටර 6.10කි). පරිධිය මීටර 9.60ක් වේ. මෙම ස්ථානයේ පානය කිරීමට සුදුසු වතුර සහිත ළිං හමුවන අතර ඒවා පැරණි ම කාලයට අයත් ඒවා වීමට පුළුවන. මෙම කලාපයේ වළං කැබලි හා උළු කැබලි බහුලව විසිරී ඇත.

**ආ. ලන්දේසි කොටුව** (09 31 653N, 079 41 976E)

ඩෙල්ෆ් ග්‍රාමීය රෝහල පිටුපස පිහිටා ඇති ලන්දේසි කොටුවට, රෝහලේ දොරටුවෙන් පිවිසිය යුතු වේ. කොටුවේ උපරිම දිග හා පළල මීටර 25×28.41 පමණ වේ. ශේෂිත සාධක අනුව උපරිම උස මීටර 6.60 පමණ වේ. බිත්තියක සාමාන්‍ය පළල මීටර 1.35 පමණ වේ. මෙය ලන්දේසි පාලනය යටතේ ඩෙල්ෆ් දිවයිනේ නිර්මාණය වූ විශාලම වාස්තුවිද්‍යා නිර්මාණය වශයෙන් සැලකිය හැකි වේ. බොහෝ දුරට විනාශ වී ඇතත් බිත්ති සමහරක් ආරක්ෂිත ව ඇත. කුටීර වෙන් වෙන් වශයෙන් හිඳුනාගත හැකි ය. සමහර ස්ථාන දෙ මහල් ව පැවත ඇත.

**ආ. අශ්ව ගාල** (09 31 007N, 079 39 482E)

දිග හා පළල මීටර 131×8.18 කි. උතුරු බිත්තිය හා කුළුණු වැඩි ප්‍රමාණයක් ආරක්ෂා වී ඇත. උස මීටර 2.5ක් හා පළල සෙන්ටිමීටර 60×60කි පැවති මුළු කණු ප්‍රමාණය 34කි. අභ්‍යන්තරය කොටස් 3ක් වන ලෙස වෙන්කර ඇත. වහලය එලදෙකේ ආකාරයට සකස් කොට පැවත ඇති අතර සෙවිලි ද්‍රව්‍යය පිළිබඳ අදහසක් ඇති කරගත නොහැක.

අශ්ව ගාලට මීටර 70ක් පමණ නැගෙනහිරින් විශ්කම්භය මීටර් 3.67ක් වන පැරණි ළිදක් දක්නට ලැබේ. 1505 වසරින් පසුව පෘතුගීසි ජාතිකයින් විසින් ඩෙල්ෆ් දූපතේ වෙළෙඳ කටයුතු ආරම්භ කොට ඇත. ඊට සමගාමීව අශ්වයින් ආනයනය කොට ඇත. භාණ්ඩ ප්‍රවාහන මාධ්‍යයක් වශයෙන් ඔවුන් අශ්වයින් භාවිත කොට ඇත. 1658 වසරේ දී පාලන බලය අත්කරගත් ලන්දේසීන් විසින් ද අශ්ව අභිජනනය පවත්වාගෙන ගොස් ඇත (Wisumperuma 2012:234). ඔවුන් භාණ්ඩ ප්‍රවාහනය මෙන් ම වෙළෙඳ භාණ්ඩයක් ලෙස ද අශ්වයින් භාවිත කොට ඇත. මෙම අශ්වයින් රඳවා තැබීම සිදහා ලන්දේසීන් විසින් මෙම ගාල නිර්මාණය කරන්නට ඇත.

**ඇ. ක්වීන්ස් ටවර්** (09 28 506N, 79 43 205E)

ලන්දේසි පාලන සමයේ දී සංඥා කුළුණක් වශයෙන් භාවිත කොට ඇති බව පෙනේ. මීටර 13ක් උස හා උපරිම ස්ථානයේ පළල මීටර 2.30ක් වන මෙම කුළුණ සැකසීම සිදහා සෙන්ටිමීටර 47×20 දිග හා පළල ඇති හිරිගල් භාවිත කොට ඇත. මේ ආශ්‍රිත මුහුදු කලාපයේ ගමන් ගන්නා නාවික යාත්‍රා හා සමීප ව පිහිටා ඇති අනෙකුත් දූපත් වෙත දුම් නිකුත් කිරීම ඔස්සේ සංඥා ලබා දීම මෙම කුළුණේ උපයෝගිතාවයි.

**ඇ. පරෙවි කූඩුව හා අවට පරිශ්‍රය** (09 31 659N, 079 42 166E)

ලන්දේසි පාලන සමයේ දී නිර්මාණය වූයා යැයි පැවසෙන මෙය ප්‍රදේශීය සභා කාර්යාලයට නුදුරින් පිහිටා ඇත. මෙහි උපරිම උස හා පළල මීටර 4.87×1.23කි. ලන්දේසි සමයේ යාපන මධ්‍යස්ථානය හා පණිවිඩ හුවමාරුව සිදහා භාවිත වූ පරවියන් ඇති කිරීම සිදහා මෙය නිර්මාණය කර ඇත. පරවියන් 80කට පමණ ලැගුම් ගතහැකි ආකාරයට සැකසූ කුටීර 80ක් දක්නට ලැබේ. පරෙවි කූඩුවට දකුණින්, දිග හා පළල මීටර 14.58×5.96 වන පැරණි ගොඩනැගිල්ලක් ඇත. එහි ඉදිරිපස බිත්තියේ බ්‍රිතාන්‍ය කිරීට ලාංඡනය සටහන් කොට ඇති අතර E:R 1905 ලෙස වසර දක්වා ඇත. ඒ අනුව මෙම ගොඩනැගිල්ල බ්‍රිතාන්‍ය පාලනය යටතේ නිර්මාණය වූවක් බැව් තහවුරු වේ. මේ ආසන්නයේ පැරණි ළිදක් හා තවත් ගොඩනැගිලි කීපයක අවශේෂ දක්නට ඇත.

**ඉ. රාම පාදය**

හිරිගල් පාෂාණය මත සටහන් වූ විශාල මිනිස් පාදයක හැඩය ගන්නා මෙම සටහන රාමායනයේ දැක්වෙන රාමගේ පාද සටහනක් වශයෙන් ජනයා අතර ප්‍රචලිත ව ඇත.

**ඊ. ලියලන ගල**

හිංදු භක්තිකයින්ගේ ගෞරවයට පාත්‍ර වූ හිරිගලකි. මෙය වාර්ෂික ව වර්ධනය වන බව වැසියන්ගේ විශ්වාසයයි. මෙහි කතරගම දෙවියන්ට කැපකළ කෝවිලක් ඇත.

**උ. බයෝබැබ් (Biobab/ *Adansonia digitata*) ගස** (09 30 745, 079 42 924E)

බයෝබැබ් ගස් කිහිපයක් ම වාර්තා වන ඩෙල්ෆ් දූපතෙ ඇති විශාලම නිදර්ශකයයි. මෙහි වටප්‍රමාණය මීටර 15ක් පමණ වේ. මීටර 8ක් පමණ දෙපසට අතු විහිදී ඇත. වෘක්ෂ කඳෙහි ඇති කුහරයේ විශාල පිරිසකට ආවරණය වී සිටිය හැක. බයෝබැබ් ශාකයේ මුල් භූමිය අප්‍රිකානු කලාපයයි (http://en.wikipedia.org/wiki/Adansonia_digitata). ආරාබි ජාතික වෙළෙඳුන් විසින් ශ්‍රී ලංකාවට මෙම ශාකය හිඳුන්වා දී ඇති බව පැවසේ.

**සාරාංශය**

පැරණි ජැටිය සහිත කලාපයේ කිමිදුම් කටයුතු සිදුකළ ද පුරාවිද්‍යා සාධක කිසිවක් අනාවරණය නොවිය. ගතකළ කාලය අඩු වීම හා මහජනතාවගෙන් ලබාගත හැකි වූ දත්ත ප්‍රමාණය අඩු වීම ඒ සිදහා බල පෑ අතර මෙහි සිදුකරන වැඩිදුර අධ්‍යයන ඔස්සේ වැඩි තොරතුරු අනාවරණය කරගත හැකි වනු ඇත. වෙරළබඩ කලාප ගවේෂණයේ දී ජැටි 2ක් පිළිබිඳ සාධක හමු විය. ගොඩබිම ගවේෂණයේ වාර්තා වූ ස්ථාන අතුරින් පැරණි ම ස්ථානය වශයෙන් බෞද්ධ ස්තූප සහිත පරිශ්‍රය හිඳුනාගත හැක. නටබුන්වල ස්වාභාවය, බ්‍රාහ්මී ශිලාලේඛනය හා වළංකටුවල රූපීය ලක්‍ෂණ අනුව මෙම පරිශ්‍රය ක්‍රිස්තු වර්ෂ 1/2 වැනි සියවස් හා

තදානුරූපි වේ. මෙම දූපතෙන් මීට ඉහත හමු වී ඇති මහායාන සම්භවයක් සහිත යැයි සැලකෙන පිළිම කොටස් (ජයසූරිය 2012:261-264) අනුව මෙම ස්ථානය මහායාන බෞද්ධාගමික ආභාෂය ලැබුණු ස්ථානයක් වශයෙන් ද සිතිය හැකි වේ. වළංකැබලි හා මැටිළිඑ බහුලතාව අනුව මෙම ප්‍රදේශය අධික මානව ක්‍රියාකාරකම් වලට ලක් වූ ස්ථානයක් බැව් පෙනී යයි. ස්ථානගත වීම හා ව්‍යාප්තිය අනුව මෙම කලාපය නාගරික ප්‍රදේශයක් ලෙස ක්‍රියාත්මක වීමට ඇතැයි සිතිය හැක. බයෝබැබ් ශාක ආරාබි වෙළෙඳුන් ගේ සම්බන්ධතාව අනියම් ආකාරයෙන් ප්‍රකට කරයි. කොටුව, අශ්ව ගාල, පැරණි ජැටිය, ක්වින්ස් ටවර්, පරෙවි කූඩුව වැනි ස්ථාන ලන්දේසි පාලනය හා සමහර වාස්තුවිද්‍යා නිර්මාණ බ්‍රිතාන්‍ය පාලනය පිළිබඳ සාධක වේ. මෙ අනුව අවම වශයෙන් ක්‍රිස්තු වර්ෂ පළමු වැනි සියවසේ සිට ම විවිධ කාලවල ඩෙල්ෆ් වාසීන් විවිධ ජාතීන් සමග මුහුද ඔස්සේ වෙළෙඳ හා සංස්කෘතික සබඳතා පවත්වා ඇති බව නීර්ණය කළ හැකි වේ.

**කෘතඥතාව**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ගාමිණී අධිකාරි, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශයේ කථිකාචාර්ය චන්දිම අඹන්වල, විශ්වබාලසිංහම් මනිමරම්, ප්‍රසාද් ෆොන්සේකා, ධනේෂ් විසුම්පෙරුම යන මහත්වරුන්ට අපගේ කෘතඥතාව හිමි වේ.

**ආශ්‍රේය ග්‍රන්ථ**

ජයසූරිය, මේනකා, (2012) ඩෙල්ෆ්ට් දූපතෙන් හමුවන තාරා දෙවිගන, පුන්කලස, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ. 261-264

Paranavitana, S. (1970) Inscription of Ceylon, Vol. I, Department of Archaeology, Combolo.

Wisumperuma, Dhanesh, Delft Stud under the British: First 10 Years, The Royal Asiatic Society of Sri Lanka, Colombo. 212-234